# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1420/4 – 2005 නොවැම්බර් 21 වැනි සඳුදා – 2005.11.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. II/80 (II).

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය ප්‍රකාර ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය, පෝෂණ හා ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍ය.

2005 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග ආහාර (බෝතල් කරන ලද හෝ අසුරන ලද ජලය) 2005 නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස හයක කාලයක් ඉකුත්වීමේ දී බලාත්මක විය යුතු ය.

I වන කොටස

*පොදු විධිවිධාන*

2. මේ නියෝගවල විධිවිධාන, බෝතල් කරන ලද හෝ අසුරන ලද ස්වාභාවික ඛණිජ හා බෝතල් කරන ලද හෝ අසුරන ලද පානීය ජලය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. (1) කිසිම තැනැත්තකු විසින් —

(අ) ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය බෝතල් කිරීම හෝ ඇසිරීම ; නැතහොත්

(ආ) බෝතල් කරන ලද හෝ අසුරන ලද ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය ආනයනය කිරීම හා බෙදා හැරීම ;

ඒ සඳහා ප්‍රධාන ආහාර බලධරයාගෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා නොගෙන කරනු නොලැබිය යුතු ය.

1A-G 006310- 4,500 (2005/11)

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම්, මේ නියෝගවල 1 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, ප්‍රධාන ආහාර බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීම පිණිස අනුගමනය කිරීම අවශ්‍යය කාර්ය පටිපාටි සැලකිල්ලට ගෙන තීරණය කරන ගාස්තුවක් ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) බෝතල් කරනු ලද්දා වූ හෝ අසුරනු ලද්දා වූ ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය ආනයනය කිරීමට හා බෙදා හැරීමට අදාළව ඉල්ලීම් කරනු ලබන ඉල්ලුම්කරුවන් විසින්, (4) වැනි ඡේදයේ කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීම් හා අදාළ වූ ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය පිළිබඳ ජල සාම්පල ඒ ඉල්ලීම් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය බෝතල් කිරීම හෝ ඇසුරුම් කිරීම සඳහා යම් ස්ථානයක්, ඒ ස්ථානය ප්‍රධාන ආහාර බලධරයා විසින් ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් සහ ඒ කාර්යය සඳහා නිකුත් කල යුතු ලියාපදිංචි කිරීමේ සහතිකය මේ නියෝගවල II වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිවලට සාරානුකූල නම් පමණක් මිස, කිසිම තැනැත්තකු විසින් පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(5) ප්‍රධාන ආහාර බලධරයා විසින්, තමා වෙත ඉල්ලීමක් ලැබීමෙන් වැඩ කරන දින හතක කාල පරිච්ඡේදයක් ඇතුළත, ආහාර පනතේ 8 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ආහාර උපදේශක කමිටුව විසින් ප්‍රධාන ආහාර බලධරයා වෙත නිර්දේශිත පරිදි, සාම්පල ද සමග එම ඉල්ලීම, පනතේ විධිවිධාන ප්‍රකාර, නිෂ්පාදනය ලියාපදිංචි කළ හැකිද, නොහැකි ද යන්න පිළිබඳ වූ නිර්දේශයක් ලබා ගැනීම සඳහා වූ නියමිත ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමක් ඇති යම් ආයතනයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) ආනයනය කරන ලද නිෂ්පාදනයක් සම්බන්ධයෙන් වන විට, ඉල්ලුම්කරු විසින් තම ඉල්ලීම සමග නිෂ්පාදනයේ සාම්පලයේ අන්තර්ගතයට අදාළව පිළිගත් රසායනාගාරයකින් ලබාගත් විශ්ලේෂණ සහතිකයක් ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ප්‍රධාන ආහාර බලධරයා විසින් තමා වෙත ඉල්ලීමක් ලැබීමෙන් වැඩ කරන දින හතක කාල පරිච්ඡේදයක් ඇතුළත, ආහාර පනතේ 8 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ආහාර උපදේශක කමිටුව විසින් ප්‍රධාන ආහාර බලධරයා වෙත නිර්දේශිත පරිදි සාම්පලය සහ විශ්ලේෂණ සහතිකය ද සමග එම ඉල්ලීම, පනතේ විධිවිධාන ප්‍රකාර, නිෂ්පාදනය ලියාපදිංචි කළ හැකිද, නොහැකිද යන බවට වූ නිර්දේශයක් ලබා ගැනීම සඳහා, නියමිත ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුමක් ඇති යම් ආයතනයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) මේ නියෝග ප්‍රකාර ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය බෝතල් කිරීම හෝ ඇසුරුම් කිරීම සඳහා, නැතහොත් බෝතල් කර ලද හෝ අසුරන ලද ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා තාක්ෂණික මතයක් සඳහා නිෂ්පාදනය යොමු කරන ලද අදාළ ආයතනයෙන් ප්‍රධාන ආහාර බලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරන තුරු ඔහු විසින් යම් තැනැත්තකු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(8) (5) වැනි හා (6) වැනි ඡේදවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති පරිදි, අදාළ ආයතනය විසින් —

(අ) පානීය ජලය හෝ ඛණිජ ජලය, ඒ නිෂ්පාදනයට අදාළව නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාවලියන්ට අනුකූලව නිෂ්පාදනය කර ඇති බවට ; සහ

(ආ) මේ නියෝගයේ සඳහන් කරනු ලැබ ඇති වෙනත් සියලු නියමයන් සපුරා ඇති බවට ;

සෑහීමට පත්විය යුතු අතර අනතුරුව, ප්‍රධාන ආහාර බලධරයා විසින් ආයතනය වෙත යොමු කරනු ලැබ ඇති නිෂ්පාදනය සම්බන්ධයෙන් වූ ස්වකීය නිර්දේශය වාර්තාවක ආකාරයෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(9) ප්‍රධාන ආහාර බලධරයා විසින්, තමා වෙත එකී වාර්තාව ලැබීමෙන් පසු එම තොරතුරු තමා වෙත දැනුම් දීමෙන් සති දෙකක කාල පරිච්ඡේදයක් ඇතුළත පනතින් නියමිත පරිදි ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. නැතහොත්, ප්‍රකාශිත හේතූන් මත, ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ නොහැකි බැව් ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(10) (9) වැනි ඡේදය යටතේ වූ තීරණය මගින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, එය ප්‍රතික්ෂේප කිරීමෙන් මාස එකක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

4. බෝතල් කරන ලද හෝ ඇසුරුම් කරන ලද ස්වාභාවික ඛණිජ ජලය හෝ පානීය ජලය හෝ නිෂ්පාදිතයක් ප්‍රධාන ආහාර බලධරයා විසින් යථා පරිදි ලියාපදිංචි කර, මේ නියෝගවල මීට ඉහතින් වූ විධිවිධානවලට අනුකූල ලියාපදිංචි අංකයක් ඊට දී ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් එම නිෂ්පාදිතයක් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා තැබීම, විකිණීම සඳහා ප්‍රවාහනය කිරීම හෝ විකිණීම සඳහා ප්‍රචාරය කිරීම හෝ නොකළ යුතු ය.

II වන කොටස

*බෝතල් කරන ලද හෝ අසුරන ලද ස්වාභාවික ඛණිජ ජලය*

5. (1) මේ නියෝගවල කාර්යය සඳහා ස්වාභාවික ඛණිජ ජලය යන්නෙන්, ස්තරයක් ඇති භූගත ජලයෙන් උපදවන්නා වූ සහ උල්පත්,ළිං හෝ කැණීම් සිදුරු වැනි ස්වාභාවික හෝ සිදුරු කිරීමේ මාර්ගවලින් මනුෂ්‍ය පරිභෝජනය සඳහා ඇඳගනු ලබන්නා වූ ජලය අදහස් වේ.

(2) (1) වැනි ඡේදයෙහි සඳහන් මාර්ග නොවන යම් මාර්ගයකින් උපදවන්නා වූ හෝ උකහා ගන්නා වූ ස්වාභාවික ඛණිජ ජලය, කිසිම තැනැත්තකු විසින් බෝතල් කිරීම හෝ ඇසුරුම් කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) බෝතල් කරන ලද හෝ අසුරන ලද ස්වාභාවික ඛණිජ ජලය, මේ නියෝගවල III වැනි උපලේඛනයේ "අ" ආකෘතියේ නිශ්චිතව සඳහන් භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජීවී විද්‍යාත්මක අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

6. මේ නියෝගවල කාර්ය සඳහා ස්වාභාවික ඛණිජ ජලය, බෝතල් කිරීමේ හෝ ඇසුරුම් කිරීමේ කටයුතු සඳහා-

(අ) කුණු, අපද්‍රව්‍ය හෝ සෞඛ්‍යයට හානි කර වෙනත් යම් ද්‍රව්‍යවලින් බැහැර විය යුතු ය ;

(ආ) මුලින් තිබූ පවිත්‍රතාවය සහතික කෙරෙන තත්ත්වයන් යටතේ එකතු කරනු ලැබිය යුතු ය ;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, වක්කිරීම හා පෙරීම හෝ වක්කිරීම හෝ පෙරීම මගින් නුසුදුසු කොටස් වෙන් කිරීමක් නොවන සහ අවශ්‍ය නම් පූර්ව වායු මිශ්‍ර කිරීමක් මගින් ඉක්මන් කරනු ලබන යම් ක්‍රියාවලියකට අමතරව යමක් කරනු නොලැබිය යුතුය ;

(ඈ) 7 වැනි නියෝගයේ දක්වා ඇති පරිදි, සනීපාරක්ෂක පූර්වෝපායන් යටතේ ප්‍රභවය මතුවීමට සමීප ස්ථානයක බෝතල් කිරීම හෝ ඇසිරීම කරනු ලැබිය යුතුය ;

(ඉ) ඇසුරුම් කිරීම සඳහා තොග බහාලුවල ප්‍රවාහනය නොකළ යුතු ය. එසේ වුවද ජලයේ පවිත්‍රතාවය පවත්වාගෙන යාමට සියලු පූර්වෝපායන් ගෙන ඇති බවට ප්‍රධාන ආහාර බලධරයා සෑහීමට පත් වේ නම්, එම ප්‍රවාහනයට අවකාශ දෙනු ලැබිය හැකි ය.

7. (1) ස්වාභාවික ඛණිජ ජලය බෝතල් කරනු ලබන්නා වූ හෝ අසුරනු ලබන්නා වූ තැනැත්තකු විසින්, ස්වාභාවික ඛණිජ ජලය බෝතල් කිරීමේ දී හෝ ඇසුරුම් කිරීමේ දී සනීපාරක්ෂක තත්ත්වයන් පවත්වාගෙන යාම සහතික කිරීමෙහි ලා අරමුණු කරගත් පහත සඳහන් නියමවලට අනුකූලව, ස්වාභාවික ඛණිජ ජලය උකහා ගැනීමෙන් පසුව, බෝතල් කරනු ලබන බවට වගබලා ගත යුතු ය.

(අ) ස්වාභාවික ඛණිජ ජලයේ රසායනික, භෞතික හෝ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ගුණවල යම් අපවිත්‍රවීමක් හෝ ඒ පිළිබඳ බාහිර බලපෑමක් ඇතිවීම වළක්වාලීම සඳහා හැකි සියලුම පූර්වෝපායයන් ගත යුතු ය. බැක්ටීරියා. වයිරස්, රසායනික පොහොර, හයිඩ්‍රොකාබන්, පලිබෝධනාශක, පවිත්‍රකාරක, ෆිනොලික් සංයෝග, ධූලකලෝහ, විකිරණශීලී ද්‍රාව්‍ය සහ වෙනත් යම් ද්‍රාව්‍ය වන කාබනික සහ අකාබනික ද්‍රව්‍ය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය. මතුපිට දූෂණයට එරෙහිව ස්වභාවධර්මයා විසින් ප්‍රමාණවත් ආරක්ෂාව සපයනු ලබන විටක දී වුව ද, පතල් කැණීම, ජල ශක්ති හා ඉංජිනේරු පහසුකම් වැනි උවදුරු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය ;

(ආ) ස්වාභාවික ඛණිජ ජලය නොවන ජලය කිසිවක් ඇතුළුවීම වලක්වාලිය හැකි යම් ආකාරයකින් ජල භූ විද්‍යාත්මක තත්ත්වයනට අනුකූලව ස්වාභාවික ඛණිජ ජලය ඉවත් කරගත යුතු ය. නැතහොත් පොම්ප කිරීමේ පහසුකම් තිබිය යුත්තේ නම්, සැපයීම අඩු කිරීමෙන් බාහිර ජලය කිසිවක් ඇතුළුවීම වළක්වාලිය යුතු ය ;

(ඇ) ජලාධාර ප්‍රදේශවලට කවරාකාරයක හෝ කිසිදු දූෂණයවීමක් සිදු නොවීම සහතික කිරීම සඳහා අයිතිකරු විසින් ආසන්නතම වටපිටාවේ ඇති උල්පත් සහ ළිං සම්බන්ධයෙන් උචිත පූර්වාවධාන පියවර ගනු ලැබිය යුතු ය ;

(ඈ) ස්වාභාවික ඛණිජ ජලය හා ස්පර්ශ වන්නා වූ සහ ජලය එකතු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ පොම්ප, පයිප්ප හෝ වෙනත් උපකරණ, ස්වාභාවික ඛණිජ ජලය මුල් තත්ත්වයෙන්ම පවත්වා ගත හැකි ද්‍රව්‍යවලින් තැනූ ඒවා බවට අයිතිකරු වගබලා ගත යුතු ය ;

(ඉ) උකහා ගැනීමේ ප්‍රදේශය තුළට බලය නොලත් තැනැත්තන්ට ඇතුල්වීමට අවකාශ නොදිය යුතු අතර, ස්වාභාවික ඛණිජ ජලය එකතු කිරීම අරමුණු කර නොගත් වෙනත් යම් කටයුතු ඒ ප්‍රදේශය ඇතුළත තහනම් කරනු ලැබිය යුතු ය ;

(ඊ) ස්වාභාවික ඛණිජ ජලය උකහා ගැනීම සඳහා සනීපාරක්ෂක ක්‍රම හා කාර්ය පරිපාටි පවත්වාගෙන යා යුතු ය. ඒ ක්‍රම හා කාර්ය පරිපාටි මනුෂ්‍යයන්ට සිදු විය හැකි සෞඛ්‍ය උපද්‍රවයක් හෝ ස්වාභාවික ඛණිජ ජලය දූෂණය කරන්නා වූ ප්‍රභවයක් නොවිය යුතු ය. උකහා ගැනීම සඳහා යොදා ගනු ලබන උපකරණ මනුෂ්‍ය සෞඛ්‍යයට සිදුවිය හැකි සියලු උපද්‍රව අඩු කෙරෙන හා දූෂණය වළක්වාලන අයුරින් තැනීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් සනීපාරක්ෂක අවශ්‍යතාවලට අතිරේකව 1989 ජුනි මස 2 වැනි දින අංක 560/13 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 ආහාර නියෝගවල සනීපාරක්ෂක අවශ්‍යතා ද බෝතල් කරන ලද්දා වූ හෝ අසුරන ලද්දා වූ ස්වාභාවික ඛණිජ ජල නිෂ්පාදනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

8. ස්වාභාවික ඛණිජ ජලය බෝතල් කරනු ලබන හෝ අසුරනු ලබන නිෂ්පාදකයකු විසින්, පහත නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන ඇසුරුම් කිරීමේ හා ලේබල් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය :—

*(අ)* සැකසුම් කිරීම හා ඇසුරුම් කිරීම එම කාර්යය සඳහා ලියාපදිංචි කරනු ලැබූ ස්ථානයෙහි කළ යුතු ය ;

*(ආ)* ජලය බාලවීමේ හෝ දූෂණය වීමේ හැකියාව වළක්වාලීම සඳහා සුදුසු වාතය ඇතුල් නොවන සේ මුද්‍රා තැබූ පිරිසිදු ආහාර වර්ග සිල්ලර බහාලූ වල අසුරනු ලැබිය යුතු ය. පූර්ණ සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ එය අසුරනු ලැබිය යුතු ය ;

*(ඇ)* ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 විධිවිධානවලට අනුකූල විය යුතු ය ;

*(ඈ)* "ස්වාභාවික ඛණිජ ජලය" යන පොදු නාමය ලේබලයේ යෙදිය යුතු ය ;

*(ඉ)* ස්වාභාවික ඛණිජ ජලය පාවිච්චි කිරීමෙන් පාරිභෝගිකයකු විසින් ලබා ගත හැකි ඖෂධීය හෝ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලේබලයේ, බෝතලයේ හෝ ඇසුරුමේ කිසිවක් මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නොකළ යුතු ය ;

*(ඊ)* ස්වාභාවික ඛණිජ ජලයේ ස්වභාවය, ප්‍රභවය, සංයුතිය හා ගුණ පිළිබඳව මහජනයාගේ සිත් තුළ අවුලක් ඇතිකළ හැකි, නැතහොත්, මහජනයා යම් ආකාරයකින් නොමග යැවිය හැකි යම් ප්‍රකාශයක්, හෝ යම් චිත්‍රමය උපක්‍රමයක් ලේබලයේ, බෝතලයේ හෝ ඇසුරුමේ මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නොකළ යුතු ය ;

*(උ)* ප්‍රධාන ආහාර බලධරයා විසින් නියම කරනු ලැබ ඇති ලියාපදිංචි අංකය, ලේබලය මත ප්‍රකට ආකාරයකින් මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

III වන කොටස

*බෝතල් කරන ලද හෝ ඇසුරුම් කරන ලද පානීය ජලය*

9. මේ නියෝගවල කාර්ය සඳහා බෝතල් කරන ලද හෝ අසුරන ලද පානීය ජලය යන්නෙන්, මනුෂ්‍ය පරිභෝජනය සඳහා සූදානම් කළ බෝතල්වල හෝ බහාලූවල මුද්‍රා තැබූ ජලය අදහස් වේ : එහෙත්, මේ නියෝගවල II වන කොටසෙහි සඳහන් ස්වාභාවික ඛණිජ ජලය ඇතුළත් නොවිය යුතු ය.

10. බෝතල් කරන ලද හෝ අසුරන ලද පානීය ජලයෙහි ස්වාභාවිකව ඇත්තා වූ හෝ හිතාමතාම එකතු කරන ලද්දා වූ ඛණිජ හා කාබන්ඩයොක්සයිඩ් ඇතුළත් විය හැකි නමුත්, සීනි, රසකාරක හෝ වෙනත් ආහාර ආකලන ඇතුළත් නොවිය යුතු ය.

11. බෝතල් කරන ලද්දා වූ හෝ ඇසුරුම් කරන ලද්දා වූ පානීය ජලය, මේ නියෝගවල IV වන උපලේඛනයේ "ආ" ආකෘතියේ නිශ්චිතව සඳහන් භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජෛව අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය. ;

12. (I) නිශ්චිත පාරිසරික ප්‍රභවයකින් ගනු ලබන ජලය භාවිතා කරමින් පානීය ජලය බෝතල් කරන ලද හෝ ඇසුරුම් කරන ලද නිෂ්පාදකයකු විසින්, ඒ පාරිසරික ප්‍රභවය ප්‍රධාන ආහාර බලධරයා සමඟ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (I) වන ඡේදය යටතේ පාරිසරික ප්‍රභවයක් ලියාපදිංචි කරන තැනැත්තකු විසින්, බෝතල් කරනු ලබන හෝ ඇසුරුම් කරනු ලබන ජලය බෝතල් කිරීම හෝ ඇසුරුම් කිරීම සඳහා, එසේ ලියාපදිංචි කරන ලද නිශ්චිත ජල ප්‍රභවය නොවන වෙනත් යම් ප්‍රභවයක ජලය පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(3) පළාත් පාලන ආයතනයක් මගින් පාලනය කරනු ලබන ප්‍රජා ජල පද්ධතියක් භාවිතයට ගනිමින්, බෝතල් හෝ ඇසුරුම් පානීය ජලය බෝතල් කරන හෝ ඇසුරුම් කරන තැනැත්තකු විසින්, ඒ ජල ප්‍රභවය ප්‍රධාන ආහාර බලධරයා සමඟ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(4) (ඈ) ඡේදය යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තකු විසින්, ඒ ඡේදය යටතේ ලියාපදිංචි කරන ලද ජල ප්‍රභවය නොවන වෙනත් යම් ප්‍රභවයකින්, බෝතල් හෝ ඇසුරුම් පානීය ජලය බෝතල් කිරීම හෝ ඇසුරුම් කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු නොලැබිය යුතු ය.

13 (1) බෝතල් හෝ ඇසුරුම් පානීය ජලය බෝතල් කරන හෝ ඇසුරුම් කරන තැනැත්තකු විසින්, ජලය උකහා ගැනීමෙන් පසුව, බෝතල් හෝ ඇසුරුම් පානීය ජලය බෝතල් කිරීමේ දී හෝ ඇසුරුම් කිරීමේ දී සනීපාරක්ෂක තත්ත්වයන් පවත්වා ගෙන යාම අරමුණු කරගත් පහත සඳහන් නිශ්චිත අවශ්‍යතා වලට අනුකූලව, බෝතල් හෝ ඇසුරුම් පානීය ජලය බෝතල් කිරීම හෝ ඇසිරීම කරනු ලැබිය යුතු ය ;

(අ) භූමි ජල ප්‍රභවයේ තත්ත්වයේ යම් දූෂණය වීමක් හෝ බාහිර බලපෑමක් ඇතිවීම වළක්වාලීම සඳහා, ආරක්ෂිත පරිමිති ඇතුලත, හැකි සියලු පූර්වාවධානයන් යොමු කළ යුතු ය ;

(ආ) ජලය උකහා ගැනීමේ පහසුකම් පවත්වා ගෙන යාම සඳහා වූ ක්‍රම හා කාර්ය පරිපාටි සනීපාරක්ෂක විය යුතු අතර, මනුෂ්‍යයන්ට ප්‍රබල උපද්‍රවයක් හෝ භූමි ජල ප්‍රභවය දූෂණය වීමේ මාර්ගයක් නොවිය යුතු ය ;

(ඇ) ජලය උකහා ගැනීමේ ස්ථානයේ සිට සැකැසුම් තිරියක දක්වා ජලය ප්‍රවාහනය කිරීම හා ගබඩා කිරීම, ක්ෂුද්‍ර ජීවීන්ගෙන් හෝ වෙනත් යම් දූෂණ වලින් ජල ප්‍රභවය, දූෂණය වීම වලක්වාලන සනීපාරක්ෂක ආකාරයකින් පවත්වාගෙන යා යුතු ය ;

(ඈ) 1989 ජුනි මස 2 වන දින අංක 560/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද 1988 ආහාර නියෝගවල සඳහන් සනීපාරක්ෂක අවශයතා, බෝතල් කරන ලද හෝ අසුරන ලද පානීය ජලය නිෂ්පාදනය සම්බන්ධයෙන් අදාළ විය යුතුය ;

(ඉ) (i) ක්ෂුද්‍ර ජීවී වර්ධනය අඩු කිරීම, ඉවත් කිරීම හෝ වර්ධනය වලක්වාලීමේ කාර්යාවලිය තුල දී, ජලයට යෙදවිය යුතු ප්‍රතිකාර වලට –

(අ) (1) අධික උෂ්ණත්වය ;
(2) පාරජම්බුල විකිරණ ;
(3) පෙරීම ;
වැනි භෞතික පිරියත

(ආ) (1) ක්ලෝරිනිකරණය ;
(2) ඕසෝනිකරණය, සහ
(3) කබොනීකරණය

වැනි රසායනික පිරියත ද, ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(ii) (i) වන අනුජේදයෙහි සඳහන් ක්‍රියාවලියක් තනිව හෝ සාමුහිකව යොදනු ලැබිය හැකි ය.

(ඊ) ජලයෙන් රසායනික කොටස් ඉවත් කිරීම හෝ අඩු කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ජලයට අදාළ කළ යුතු ක්‍රියාවලියට.–

(i) විශේෂ (යාන්ත්‍රික ) පෙරීම ;
(ii) වැලි හෝ සම්පිණ්ඩන කෙඳි පෙරහන් වැනි ගැඹුරු පෙරහන් ;
(iii) කාඩ්රිජ් පෙරහනය ;
(iv) පෙරහන ;
(v) රැලිපටල පෙරහන් වැනි පෘෂ්ඨ පෙරහන් ;
(vi) සක්‍රීය කළ කාබන් පෙරහන් ;
(vii) වාතනය ;
(viii) ඛණිජ හරණය – අයනීහරණය හා/හෝ ජල මෘදු කිරීම ;

ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(උ) ජලයට අනතුරුදායක ද්‍රව්‍ය කිසිවක් එකතු වීම වළක්වාලීම සඳහා ජල පිරියම් කිරීමෙහි ලා යොදා ගනු ලබන අමු ද්‍රව්‍ය හෝ මිශ්‍රණ ද්‍රව්‍ය හොඳ තත්ත්වයේ විය යුතු ය. උචිත අවස්ථාවක දී පාවිච්චි කිරීමේ යෝග්‍යතාව තහවුරු කිරීම සඳහා අමු ද්‍රව්‍ය සඳහා වූ පිරිවිතර හඳුනා ගැනීම හා අදාල කිරීම කළ යුතු අතර, රසායනාගාර පරීක්ෂණ කළ යුතු ය ;

(ඌ) බෝතල් කිරීමේ කටයුතු ආවෘත ප්‍රදේශයක පවත්වා ගෙන යා යුතු ය. වාතය දූවිල්ලෙන්, ක්ෂුද්‍ර ජීවීන්ගෙන් බැහැර විය යුතු ය ;

14. බෝතල් කරන ලද හෝ ඇසුරුම් කරන ලද පානීය ජලය නිෂ්පාදනය කරන තැනැත්තෙකු විසින්, පහත සඳහන් ඇසුරුම් කිරීමේ හා ලේබල් කිරීමේ නියමවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය :—

(අ) සැකසුම් හා ඇසුරුම් කිරීම, ඒ කාර්යය සඳහා ලියාපදිංචි කරන ලද ස්ථානයෙහි, සිදුකළ යුතු ය ;

(ආ) ජලය බාල වීමේ හෝ දූෂණය වීමේ හැකියාව වළක්වාලීම සඳහා සුදුසු වාතය ඇතුල් නොවන හෝ මුද්‍රා තැබූ පිරිසිදු ආහාර වර්ග සිල්ලර බහාලුවල අසුරනු ලැබිය යුතු ය. පූර්ණ සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ එය අසුරනු ලැබිය යුතු ය ;

(ඇ) ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ ) නියෝග 2005 විධිවිධාන වලට අනුකූල විය යුතු ය ;

(ඈ) "පානීය ජලය" යන පොදු නාමය ලේබලයේ යෙදිය යුතු ය ;

(ඉ) පානීය ජලය පාවිච්චි කිරීමෙන් පාරිභෝගිකයෙකු විසින් ලබාගත හැකි වෛද්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලේබලයේ, බෝතලයේ හෝ ඇසුරුමේ කිසිවක් මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නොකළ යුතු ය ;

(ඊ) පානීය ජලයේ ස්වභාවය, ප්‍රභවය, සංයුතිය හා ගුණ පිළිබඳව මහජනයාගේ සිත් තුළ අවුලක් ඇතිකළ හැකි, නැතහොත් යම් ආකාරයකින් මහජනයා නොමඟ යැවිය හැකි යම් ප්‍රකාශයක් හෝ යම් චිත්‍රමය උපක්‍රමයක් ලේබලයේ, බෝතලයේ හෝ ඇසුරුමේ මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නොකළ යුතු ය ;

(උ) ප්‍රධාන ආහාර බලධරයා විසින් නියම කරනු ලැබ ඇති ලියාපදිංචි අංකය, ලේබලය මත ප්‍රකට ආකාරයකින් මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

IV වන කොටස

*අර්ථ නිරූපනය*

13. මේ නියෝගවල කාර්යය සඳහා –

"ප්‍රධාන ආහාර බලධරයා" යන්නෙන්, 1980 අංක 26 දරන ආහාර පනතෙහි නිර්වචනය කරනු ලැබ ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අදහස් වේ. තවද :

"නිෂ්පාදනය කිරීම" යන්නට, 1980 අංක 26 දරන ආහාර පනතෙහි, ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

*උපලේඛනය – I*

[3(2) නියෝගය]

බෝතල් කළ (ඇසුරුම් කළ ) ස්වාභාවික ඛණිජ ජලය සහ බෝතල් කළ (ඇසුරුම් කළ) පානීය ජලය නිපදවන පරිශ්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

| | |
|---|---|
| 1. ලියාපදිංචි අයදුම් කරනු ලබන නිෂ්පාදන : ආයතනයේ නම | |
| 2. ලියාපදිංචි ලබාගැනීමට අපේක්ෂිත පරිශ්‍රයේ සම්පූර්ණ ලිපිනය ( නිවාස අංකය, කොට්ඨාශ අංකය, වීථි අංකය, වීථි සීමාවන්) දළ සැලැස්ම අමුණන්න : | |
| 3. නිෂ්පාදනය කරනු ලබන හෝ නිෂ්පාදනය කිරීමට යෝජිත ආහාර වර්ගයේ ස්වභාවය : | බෝතල් වල අසුරණ ලද පානීය ජලය/ බෝතල්වල අසුරණ ලද ස්වාභාවික ඛනිජ ජලය (ආදාළ නොවන දේ කපා දමන්න.) |
| 4. සමාගමේ ස්වභාවය – රජයේ හෝ සී/ ස. පෞද්ගලික ආයතනයක් ද, හවුල්කාර හෝ හිමිකාර ආයතනයක් ද යන වග කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ සහ කාර්මික අධ්‍යක්ෂවරයාගේ (ඇතොත් හවුල්කරුවන්ගේ / හිමිකාරයාගේ (අදාල වන පරිදි ) නම සහ ලිපිනය : | |

| | |
|---|---|
| 5. ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවීමට බලයලත් තැනැත්තාගේ නම සහ ලිපිනය සහ සමාගමේ ඔහු දරන තනතුර ; | |
| 6. නිෂ්පාදනයේ වෙළඳ නාමය ; | |
| 7. කලින් ලියාපදිංචියක් ඇත්නම් එහි අංකය සහ දිනය | |
| 8. ලියාපදිංචි ගාස්තු වශයෙන් ප්‍රේෂණය කළ මුදල් වල විස්තර | රු. ................... කුවිතාන්සි අංකය :................. දිනය :................. |
| 9. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහතිකය (i) දේශීය නිෂ්පාදන. (අනුමැතියේ සහතික පිටපතක් ඇමිණිය යුතු ය.) | ශ්‍රී.ල. ප්‍ර අංකය. :................. දිනය :.................. |
| (ii) ආනයනික නිෂ්පාදන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්දේශයේ මුල් පිටපත ඇමිණිය යුතු ය. | |

ලියාපදිංචිය සඳහා අවශ්‍ය සියලුම ලිපි ලේඛන අමුණා ඇත.

මා විසින් ඉහතින් සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවට සහතික කරමි.

..................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.................

II *වන උපලේඛනය*

[3(4) වන නියෝගය]

ආදර්ශ ආකෘති පත්‍රය

බෝතල් කළ (ඇසුරුම් කළ ) ස්වාභාවික ඛණිජ ජලය /බෝතල් කළ (ඇසුරුම් කළ ) පානීය ජලය නිෂ්පාදනය කිරීම සහ විකිණීම සඳහා පරිශ්‍රයක් ලියාපදිංචි කිරීම ;

ලියාපදිංචි අංකය :.........................................

1991 අංක 20 දරන ආහාර (සංශෝධිත ) පනතින් සංශෝධිත පරිදි 1980 අංක 26 දරන ආහාර පනතේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිශ්‍රය බෝතල් කළ (ඇසුරුම් කළ ) පානීය ජලය/ බෝතල් කළ (ඇසුරුම් කළ ) ස්වාභාවික ඛනිජ ජලය නිෂ්පාදනය කිරීම සහ විකිණීම සඳහා මෙයින් ලියාපදිංචි කරනු ලැබේ.

අයදුම්කරුගේ නම සහ ලිපිනය :—

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

නිෂ්පාදන යන්ත්‍රාගාරය පිහිටි ස්ථානය .–

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

නිෂ්පාදනයේ වෙළෙඳ නාමය : ..............................................................................................

..............................................................................................

..............................................................................................

.සැ. යු. ඉහත සඳහන් ව්‍යවස්ථා විධිවිධාන වලින් කවර හෝ විධිවිධානයක් කඩ කළහොත්, ලියාපදිංචිය අවලංගු කිරීමට යටත්වනු ඇත.

ප්‍රධාන ආහාර බලධාරියා,

තිල මුද්‍රාව :————

දිනය :————

[5 (3) වන නියෝගය]

III *වන උපලේඛනය*

(අ) ආකෘතිපත්‍රය

බෝතල් කළ (ඇසුරුම් කළ) ස්වභාවික ඛණිජ ජලය සඳහා භෞතික, රසායනික සහ ක්ෂුද්‍රජීව අවශ්‍යතා

| *ගති ලක්ෂණ* | *අවශ්‍යතා* |
|---|---|
| වර්ණය (උපරිම) | හේසන් ඒකක 5 |
| සුවඳ | අප්‍රිය නොමැති |
| රසය | අප්‍රිය නොමැති |
| බොරභාවය-NTU. (උපරිම) | 5.0 |
| මුළු සාන්ද්‍රණ ඝන ද්‍රව්‍ය මි.ග්‍රෑ./ලී (උපරිම) | 1500.0 |
| As වශයෙන් ආසනික් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.01 |
| Cd වශයෙන් කැඩ්මියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.003 |
| CN වශයෙන් සයිනයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.07 |
| Cr වශයෙන් ක්‍රෝමියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.05 |
| Hg වශයෙන් මර්කරි මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.001 |
| Ni වශයෙන් නිකල් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.02 |
| Se වශයෙන් සෙලනියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.01 |
| Pb මි.ග්‍රෑ./ලී වශයෙන් ඊයම්(උපරිම) | 0.01 |
| Cu වශයෙන් තඹ මි.ග්‍රෑ./ලී (උපරිම) | 1.0 |
| Sb වශයෙන් ඇන්ටිමනි මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.005 |
| Be වශයෙන් බෙරිලියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.7 |
| Mn වශයෙන් මැංගනීස් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.5 |
| Cl වශයෙන් ක්ලෝරයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 250.0 |
| F වශයෙන් ෆ්ලෝරයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 1.5 |
| $No_3$ වශයෙන් නයිට්‍රේයිට් මි.ග්‍රෑ./ලී (උපරිම) | 50.0 |
| $No_2$ වශයෙන් නයිට්‍රයිට් මි.ග්‍රෑ./ලී (උපරිම) | 3.0 |
| Al වශයෙන් ඇලුමිනියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.2 |
| $H_2S$ වශයෙන් සල්ෆයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.05 |
| ෆීනෝලික් මිශ්‍රණ සහ ඛණිජ තෙල් | නොතිබිය යුතුයි |
| ඊ කෝලයි සහ කෝලිෆෝම් | නොතිබිය යුතුයි |
| රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන් | නොතිබිය යුතුයි |
| ග්‍රීස් සහ තෙල් | නොතිබිය යුතුයි |

*IV වන උපලේඛනය*

*(ආ) ආකෘතිපත්‍රය*

(11 වන නියෝගය)

**බෝතල් කළ (ඇසුරුම් කළ) පානීය ජලය සඳහා භෞතික, රසායනික, සහ ක්ෂුද්‍රජීව අවශ්‍යතා**

| | |
|---|---|
| වර්ණය | හේසන් ඒකක 15 |
| සුවඳ | අප්‍රිය නොමැති |
| රසය | අප්‍රිය නොමැති |
| බොරහාවය-NTU. (උපරිම) | 05.0 |
| pH | 6.5 සිට 8.5 දක්වා |
| මුළු සාන්ද්‍රණ ඝන ද්‍රව්‍ය මි.ග්‍රෑ. /ලී. (උපරිම) | 1000.0 |
| Cl වශයෙන් ක්ලෝරයිඩ් මි. ග්‍රෑම්./ලී. (උපරිම ) | 250.0 |
| $Cl_2$ වශයෙන් නිදහස් අවශේෂ ක්ලොරීන් මි. ග්‍රෑ. /ලී. (උපරිම) | 0.2 |
| $CaCO_3$ වශයෙන් ක්ෂාරත්වය මි. ග්‍රෑ./ලී. (උපරිම( | 200.0 |
| $NH_3$ වශයෙන් නිදහස් ඇමෝනියා මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.06 |
| $NO_3$ වශයෙන් නයිට්රේට් මි.ග්‍රෑ./ලී (උපරිම) | 50.0 |
| $NO_2$ වශයෙන් නයිට්රයිට් මි.ග්‍රෑ./ලී (උපරිම) | 3.0 |
| F වශයෙන් ෆ්ලොරයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 1.5 |
| මුළු කඨිනත්වය $CaCo_3$ මි.ග්‍රෑ./ලී (උපරිම) | 250.0 |
| $SO_2$ වශයෙන් සල්ෆේට් මි.ග්‍රෑ./ලී (උපරිම) | 250.0 |
| Cr වශයෙන් ක්‍රෝමියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.05 |
| Ni වශයෙන් නිකල් මි.ග්‍රෑ./ලී උපරිම | 0.02 |
| Fe වශයෙන් මුළු යකඩ ප්‍රමාණය මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.3 |
| Cu වශයෙන් තඹ මි.ග්‍රෑ./ලී (උපරිම) | 1.0 |
| Mn වශයෙන් මැංගනීස් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.5 |
| Zn වශයෙන් සින්ක් මි.ග්‍රෑ./ලී (උපරිම) | 3.0 |
| Al වශයෙන් ඇලුමිනියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.2 |
| As වශයෙන් ආසනික් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.01 |
| **Cd** වශයෙන් කැඩ්මියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.003 |
| Pb වශයෙන් ඊයම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.01 |
| Hg වශයෙන් රසදිය මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.001 |
| Se වශයෙන් සෙලේනියම් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.01 |
| CN වශයෙන් සයනයිඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | 0.07 |
| රසායනික අම්ලකර අවශ්‍යතාවය ( COD) මි.ග්‍රෑ./ලී (උපරිම) | 10.0 |
| ෆෙනොලික් OH වශයෙන් ෆෙනොලික් කම්පවුන්ඩ් මි.ග්‍රෑ./ලී (උපරිම) | නොතිබිය යුතුයි |
| ග්‍රීස් සහ තෙල් මි.ග්‍රෑ./ලී (උපරිම) | නොතිබිය යුතුයි |
| ඊකොලයි සහ කෝලිෆෝම් | නොතිබිය යුතුයි |
| රෝගකාරක ක්ෂුද්‍රජීවීන් | නොතිබිය යුතුයි |

12-77

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2-G 006310